www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA

ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 8 ශ්‍රේණිය | නර්තනය | ඒකකය: 5 |
|---|---|---|

## 5 - 1 නර්තන කලාව හා සබැඳි මූලාශ්‍ර හඳුනාගනිමු.

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1) නලඟන රූප දක්නට හැකිවන ස්ථානයක් නොවන්නේ,
1) ගනේගොඩ විහාරය 2) ගඩලාදෙණියේ ආලින්දයේ පාදම
3) මුල්කිරිගල 4) මිහින්තලේ කණ්ඨක චෛත්‍යය

2) කණුවක වෙස් බැඳි නැට්ටුවෙකුගේ හා නිළියකගේ රූප කැටයම් කර ඇති ස්ථාන දෙකක් ඇතුළත් වන්නේ,
1) ලෝවාමහාපාය, පනාපිටිය අම්බලම
2) ඇම්බැක්කේ කතරගම දේවාලය, ගනේගොඩ විහාරය
3) අම්බුළුගල ටැම්පිට විහාරය, ලෝවාමහාපාය
4) පනාපිටිය අම්බලම, ඇම්බැක්කේ කතරගම දේවාලය

3) වේගයෙන් භ්‍රමණය වන නළඟනකගේ රූපයක් හමු වී ඇත්තේ,
1) ලෝවාමහාපායෙන් 2) අනුරාධපුර කුට්ටම් පොකුණෙන්
3) මිහින්තලයෙන් 4) ශිව දේවාලයෙන්

4) කරණ 108 න් එක් ඉරියව්වකට සමාන මිනිස් රූපයක් දක්නට ලැබෙන ස්ථානයකි.
1) මැදිරිගිරිය වටදාගෙය 2) යාපහුව දළදා මාළිගාව
3) පනාපිටිය අම්බලම 4) ගඩලාදෙණිය විහාරය

5) ඇත් පහනේ නළඟනකගේ ලෝහමය රූපයක් දක්නට ලැබෙන්නේ,
1) දැදිගම කොට වෙහෙරේ 2) දෙවිනුවර දේවාලයේ
3) අම්බුළුගල ටැම්පිට විහාරයේ 4) බෙන්තර ගලපාත විහාරයේ

**හිස්තැන් පුරවන්න.**

6) පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර යටතේ ...................................................... ඇසුරෙන් නර්තන කලාව පැවති බවට සාධක හඳුනාගත හැකිය.
7) කණුවල උඩැක්කි හා එකැස්බෙර දක්නට ලැබෙන ස්ථානයකි ......................................................
8) පහතරට නර්තන විලාසය හා සමාන නැට්ටුවෙකුගේ රූපයක් ...................................................... දක්නට ලැබේ.
9) ...................................................... බාල්කයක කැටයම් කර ඇති ලී කෙලි නැටුමක් දක්නට ලැබේ.
10) සම්යුත හා අසම්යුත හස්ත මුද්‍රා රාශියක් ...................................................... බිතු සිතුවම්වල දක්නට ලැබේ.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

**ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

11) ආගමික අවස්ථා සඳහා නර්තන යොදාගෙන ඇති බවට සාධක දෙකක් දක්වන්න.

12) අතීතයේ වාද්‍ය භාණ්ඩ භාවිතා කළ බවට සාක්ෂි දැක්විය හැකි සාධක 03 ක් ලියන්න.

13) නර්තනයන් සඳහා කාන්තාවන් සහභාවී වී ඇති බවට කරුණු අනාවරණය කෙරෙන සාධක 03ක් දක්වන්න.

14) ගල් කැටයම්, සිතුවම්, මූර්ති යන රූකම් වලින් ඔබ කැමති රූකම් වර්ගයක් තෝරාගෙන එකල නර්තනය පැවති ස්වභාවය පිළිබඳ අවම සාධක 03ක් ඇසුරෙන්වත් විස්තර කරන්න.

15) ''නර්තන කලාවට භාරතීය ආභාසය ලැබී ඇති බවට කරුණු හෙළිවේ'' සාධක දෙකක් ඇසුරින් ඉහත කියමන සනාථ කරන්න.

සැකසුම : ඒ.ජී.එස්. මෙන්ඩිස් මිය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

NALANDA VIDYALAYA **නාලන්දා විද්‍යාලය - කොළඹ 10**

**ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය**

**8 ශ්‍රේණිය** | **නර්තනය** | **ඒකකය: 5**

**5.2 ශාන්තිකර්ම හඳුනාගනිමු (දෙවොල් මඩු ශාන්තිකර්මය)**

(1) ''ශාන්ති කර්ම'' යනු කෙටියෙන් හඳුන්වන්න.

(2) දේශීය නර්තන සම්ප්‍රදායන්ට 03 ට අයත් ප්‍රධාන ශාන්තිකර්ම නම් කරන්න.

(3) දෙවොල් මඩු ශාන්තිකර්මයේ පුරාවෘත්ත කතාව ලියන්න.

(4) මෙම ශාන්තිකර්මයේ යොදා ගනු ලබන රංග වස්ත්‍රාභරණ පිළිබඳ විස්තර කරන්න.

(5) දෙවොල් මඩුවේ යොදා ගන්නා සැරසිලි හා රංග භාණ්ඩ පිළිබඳ විස්තරයක් කරන්න.

(6) දෙවොල් මඩුව ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| පැවැත්වීමට හේතු | පුද ලබන දෙවිවරුන් සහ යකුන් | චාරිත්‍ර විධි |
|---|---|---|
| | | |
| නර්තන අංග | ගායන හා වාදන අංග | නාට්‍යමය අංග |
| | | |

**සැකසුම : ඒ.ජී.එස්. මෙන්ඩිස් මිය**



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

NALANDA VIDYALAYA **නාලන්දා විද්‍යාලය - කොළඹ 10**

**ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය**

**8 ශ්‍රේණිය** | **නර්තනය** | **ඒකකය: 5**

### 5.3 නර්තන ශිල්පීන් අගයමු

එස්. පණීභාරත ගුරුතුමා, කේ. එස්. ප්‍රනාන්දු ගුරුතුමා සහ ඩී. වී. හීන්නිලමේ ගුරුතුමා පිළිබඳ පහත මාතෘකා යටතේ වගුවක් ඇසුරු කරගෙන වෙන් වෙන් වශයෙන් සාකච්ඡා කරන්න.

* ජීවන තොරතුරු
* සුවිශේෂ කුසලතාවන්
* නර්තන කලාවේ ප්‍රගමනය සඳහා මෙම ශිල්පීන්ගෙන් ලැබුණු දායකත්වය.

**සැකසුම : ඒ.පී.එස්. මෙන්ඩිස් මිය**

Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk